ස.සේ.කො. චක්‍රලේඛ 03/2020 (ii)

මගේ අංකය : ස.සේ.කො./01/iv වෙළුම,
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ)
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2023.01.

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

<u>බඳවා ගැනීමේ මූලික සුදුසුකම් සංශෝධනය කිරීම.</u>

ස.සේ.කො.03/2020 චක්‍රලේඛයේ පහත දක්වා ඇති තනතුරු සඳහා සඳහන් කර ඇති බඳවා ගැනීමේ සුදුසුකම්වලට අමතරව පහත වගන්තිවල සඳහන් සුදුසුකම් ද ඇතුලත් කිරීමෙන් සංශෝධනය කිරීමට 2023.01.10. දිනැති කොමිෂන් සභා අංක 34/2022 දරණ නියෝගය පරිදි මෙයින් දැනුම් දෙනු ලැබේ.

| මට්ටම | තනතුරු නාමය | වැටුප් සංකේත අංකය | ශ්‍රේණිය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|---|
| | | | | බාහිර බඳවා ගැනීම්(විවෘත) | අභ්‍යන්තර බඳවා ගැනීම්(සීමිත) |
| මධ්‍ය විධායක | 05. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) <u>(A හා B ශ්‍රේණියේ සමුපකාර සමිති සඳහා</u> | MEL | III | (ඇ) පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් ලබා ගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම සමඟ බැංකු ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු අධීක්ෂණ මට්ටමේ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. | (ඇ)පොල්ගොල්ල ජාතික සමුපකාර සංවර්ධන ආයතනයෙන් ලබා ගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ගණකාධිකරණ ඩිප්ලෝමාව සමත්වීම සමඟ බැංකු අංශයේ, TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 හා හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |
| අධීක්ෂණ ඉහල | 26. ලේකම් | TSL | III | | (ඇ) ජාතික සමුපකාර මණ්ඩලයේ වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ලේකම් පරිචය පිළිබඳ ඩිප්ලෝමාව සමත්වීම සමඟ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 ක හෝ OL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

| මට්ටම | තනතුරු නාමය | වැටුප් සංකේත අංකය | ශ්‍රේණිය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් | |
|---|---|---|---|---|---|
| | | | | බාහිර බඳවා ගැනීම(විවෘත) | අභ්‍යන්තර බඳවා ගැනීම(සීමිත) |
| අධීක්ෂණ | 28. බැංකු කළමනාකරු | SL | III | | (ඉ) OL වැටුප් පරිමාණයේ සහකාර බැංකු කළමනාකරු තනතුරට අදාල මුලික සුදුසුකම් සපුරා ඇති, සම්පූර්ණ සේවා කාලයම බැංකු අංශයේම කළමනාකරණ සහකාර තනතුරක සේවය කිරීම හා එම තනතුරේ I ශ්‍රේණියේ වසර 01 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම. |

02. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ) ගේ එකඟතාවය ඇතිව බවට ද දැනුම් දෙනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එච්.එම්.පී.කේ.හේරත්
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

<u>පිටපත්:</u>

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.

02.ලේකම්, සමුපකාර සංවර්ධන වෙළඳ,ඉඩම්,විදුලිබල,හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු සංස්කෘතික,කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.පි.

03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.පි.හා අ.ක.ස.

04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි. හා අ.ක.ස.

05.සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස්-කුරුණෑගල/හලාවත/කුලියාපිටිය - දැ.පි.හා අ.ක.ස.